# අය වැය ලේඛනය
# வரவுசெலவுத்திட்டம்
# BUDGET REPORT
# 2017




## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## அங்குணகொலபெலெஸ்ஸ பிரதேச சபை
## ANGUNAKOLAPELASSA PRADESHIYA SABHA

# 2017 වර්ෂය

# අය වැය ලේඛනය

2016. 11.30 වන දින මුදල් හා

ප්‍රතිපත්ති කමිටුවේ තීරණ අංක 01

යටතේ නිර්දේශ විය.

# පටුන


| | පිටු අංක |
|---|---|
| 01. දැක්ම හා මෙහෙවර ප්‍රකාශනය | 01 |
| 02. ප්‍රාදේශීය සභා ලේකම්ගේ පණිවුඩය | 02 |
| 03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය -සිතියම | 03 |
| 04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය -හැඳින්වීම | 04-05 |
| 05. බල ප්‍රදේශයේ මූලික තොරතුරු | 06 |
| 06. බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිළධාරි වසම් | 07-08 |
| 07. බල ප්‍රදේශයේ මාර්ග තොරතුරු | 09 |
| 08. පොලිස් බල ප්‍රදේශ අනුව ග්‍රාම නිළධාරි වසම් | 10-11 |
| 09. සම්බන්ධීකරණ තොරතුරු | 12 |
| 10. සංවිධාන ව්‍යුහය | 13 |
| 11. සේවක සංඛ්‍යා තොරතුරු | 14 |
| 12.ආයතනය යටතේ පාලනය වන භෞතික සම්පත් හා ආයතන | 15 |
| 13. සභාව සතු රථ වාහන | 16 |
| 14.පෙර වසර වල මූල්‍ය විශ්ලේෂණය | 17-24 |
| 15.2017 වර්ෂයේ අයවැය සාරාංශය | 25 |
| 16. වැඩසටහන් හැඳින්වීම | |
| ▪ වැඩසටහන් අංක 01 -පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 26-27 |
| ▪ වැඩසටහන් අංක 02 - සෞඛ්‍ය සේවා | 28-29 |
| ▪ වැඩසටහන් අංක 03 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැඟිලි | 30 |
| ▪ වැඩසටහන් අංක 05 - මහජන උපයෝගී සේවා | 31 |
| ▪ වැඩසටහන් අංක 06 - සුභසාධක හා විහරණ සේවා | 32 |
| 17. 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු සාරාංශය | 33 |
| 18.2017 වර්ෂයේ පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු සාරාංශය | 34 |
| 19.2017 වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු සාරාංශය | 35 |
| 20. වැඩසටහන් අංක 01- පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | |
| I. ආදායම් ප්‍රභවයන් | 36-37 |
| II. ආදායම් ඇස්තමේන්තු | 38 |
| III. වියදම් ඇස්තමේන්තු | 39-40 |
| 21. වැඩසටහන් අංක 02 - සෞඛ්‍ය සේවා | |
| I. ආදායම් ප්‍රභවයන් | 41-44 |
| II. ආදායම් ඇස්තමේන්තු | 45 |
| III. වියදම් ඇස්තමේන්තු | 46 |

22. වැඩසටහන් අංක 03 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි
I. ආදායම් ප්‍රභවයන් 47-48
II. ආදායම් ඇස්තමේන්තු 49
III. වියදම් ඇස්තමේන්තු 50
23. වැඩසටහන් අංක 05 - මහජන උපයෝගී සේවා
I. ආදායම් ප්‍රභවයන් 51-53
II. ආදායම් ඇස්තමේන්තු 54
III. වියදම් ඇස්තමේන්තු 55
24. වැඩසටහන් අංක 06 - සුභසාධක හා විහරණ සේවා
I. ආදායම් ප්‍රභවයන් 56-57
II. ආදායම් ඇස්තමේන්තු 58
III. වියදම් ඇස්තමේන්තු 59
25. 2017 ප්‍රාග්ධන ආදායම් ඇස්තමේන්තු 60
26. 2017 ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු 61
27.2017 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සහ ණය වාරික ගෙවීම සඳහා දායකත්වය 62

# අපගේ දැක්ම

ප්‍රජා නායකත්වය හා ප්‍රජා දායකත්වය සාර්ථකත්වයේ යදමක් කර ගනිමු.

# OUR VISION

Let's make the community leadership and community contribution the strong base of the success.

# අපගේ මෙහෙවර

සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභවාදී ආකල්ප මත සුභ සාධනයේ හා සංවර්ධනයේ සමායෝජනයෙන් ඵලදායී හා ස්ථායීකරණ ආර්ථිකයක් කරා යාමට නිරන්තර දායකත්වය හා කැපවීම අපගේ මෙහෙවරයි!

# OUR MISSION

Our mission is to provide constant contribution and dedication to achieve an effective and stable economy through the coordination of welfare and development based on positive attitudes of the people living in the area of Pradeshiya Sabha.

# ලේකම් තුමියගේ පණිවුඩය.



අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනාගත අභිවෘද්ධිය හා පුනර්ජීවය වෙනුවෙන් අඟුණකොළපැලැස්ස බල ප්‍රදේශයේ සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව ජනතා මෙහෙවරට ඇප කැප වී කටයුතු කරන්නේ බල ප්‍රදේශයේ ජනතාවගේ හෙට දිනය ආලෝකමත් කිරීමේ ඒකායන අදිටනින්ය.

එකී අරමුණු පෙරදැරිව සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික යන සෑම අංශයක්ම සංවර්ධනය කරමින් අනාගතයේදී තව තවත් නිර්මාණශීලී ඉදිරි දැක්මකින් නොනිමි ජාතික මෙහෙවරක් උදෙසා අත්වැල් බැඳගෙන ඉදිරියට යන ගමනේදී අප හට නොමසුරු සහයෝගයක් ලබා දෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු, පළාත් සභා මැති ඇමතිතුමන්ලා, පළාත් පාලන අමාත්‍යාංශය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම, බෞද්ධ ආගමික ස්ථානවල ගරුතර මහා සංඝරත්නය සිහිපත් කරන්නේ බැතිබර සිතිනි.

එවන් පසුබිමක සිට 2017 වර්ෂයේ සංවර්ධන සහ මෙහෙයුම් සැළැස්ම - අය වැය ලේඛනය පිළියෙල කර ඇත. ඒ සඳහා යෝධ ශක්තියක් වෙමින් බල ප්‍රදේශයේ සංවර්ධනය තුළින් ආශ්චර්යමත් දේශයක් කරා යන ගමනට අත්වැලක් වීම අපගේ උත්සාහයයි. 1991 වර්ෂයේ සිට මේ දක්වා අප ආ ගමනේදී ආපසු හැරී බලන විට මෙතෙක් ඉටු නොවූ යම්කිසි කාර්යයක් හා කර්තව්‍යයක් වන්නේ නම් එය නොපිරිහෙලා ඉටුකිරීම යුතුකමක් සේ සළකා අප යන මෙම දුෂ්කර ගමනේදී මෙතෙක් අප සමඟ අත්වැල් බැඳ සපැමිණි ඔබ සැමගේ නොමසුරු සහයෝගය හා ධෛර්යසම්පන්න කැපවීම ඉදිරියටද එලෙසින්ම ලැබේයැයි අපේක්ෂා කරමි.

අප සතුව පවත්නා අතිශය සීමිත වූ සම්පත් උපයෝගී කර ගනිමින් සියළු ජනතාවගේ පැතුමන් කිසිවෙකුට අසාධාරණයක් නොවන අයුරින් පෙළ ගස්වා ක්‍රියාත්මක කිරීමට ඔබ සියළු දෙනාගේ විචක්ෂණශීලී සාධාරණ චින්තනය අත්‍යාවශ්‍ය සාධකයක් වනු ඇත. අපෙන් ඔබට සහ ඔබෙන් අපට ලැබෙන දේ මෙන්ම, ලැබිය යුතු දේත්, ලබාගත හැකි දේත් සළකා බලා බල ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ඒකාත්මික වීම යුගයේ අවශ්‍යතාවයකි. මෙම තත්වයන් තේරුම් ගනිමින් අප සියල්ලන් අත්වැල් බැඳගැනීම අපගේ නිෂ්ඨාව වෙත ගමන් කරන කෙටිම මාර්ගය බව මාගේ අදහසයි. එය වාර්ෂික අය වැය මඟින් ඉදිරිපත් කරන රුපියල් ශත වලට වඩා ප්‍රභලතම හා විශිෂ්ඨතම කාර්යය වන්නේය.

ඔබ සැමට සුභ අනාගතයක්!

අනුලා කුඹල්ගොඩ ආරච්චි,

ලේකම්,

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව.

# ANGUNAKOLAPELESSA PRADESHIYA SABHA AREA



# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බලප්‍රදේශය

## හැඳින්වීම

### පිහිටීම

දක්ෂිණ ලංකාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා ඇත. අක්ෂාංශ හා දේශාංශ පිහිටීම අනුව උතුරු අක්ෂාංශ $6^0$ 9’ 51 සහ නැගෙනහිර දේශාංෂ $80^0$53’53” අතර පිහිටා ඇති අතර නැගෙනහිර දිශාව අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාවෙන්ද , දකුණු දිශාවට තංගල්ල ප්‍රාදේශීය සභා සීමාවෙන්ද උතුරු දිශාවට රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාවෙන්ද, බටහිර දිශාවට වීරකැටිය හා කටුවන ප්‍රාදේශීය සභා සීමාවෙන්ද මායිම් වේ.

සිංහල රාජ සමය කරා දිවයන අතීතයකට උරුමකම් කියන මෙම බල ප්‍රදේශය සොබා දහමින් ලත් අපූර්වත්වයද එක් කරගනිමින් වර්තමානය වන විට ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා ආගමික අංශ වලින් පොහොසත්ව සංවර්ධනයේ ඉලක්ක සපුරා ගනිමින් සිටිනා රටට බත සපයන වී බිස්සක් ලෙස අඟුණකොළපැලැස්ස පුරවරය හැඳින්විය හැක.

ග්‍රාම සේවා වසම් 51කින්(ගම් 108කි) සමන්විත මෙම බල ප්‍රදේශයේ විශාලත්වය වර්ග කි.මී.173.06ක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙන් 6.8%) වන අතර ජනගහනය 57728කි.

මෙම බල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ වෙරළබඩ සිට මදක් අභ්‍යන්තරයේ පිහිටා ඇත. පොදුවේ තැනිතලා ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි වුවද බල ප්‍රදේශයේ දකුණු හා බටහිර කොටස් වල බොහෝ දුරට දක්නට ලැබෙන්නේ රැළි බිම් ස්වභාවයකි. උතුරු ප්‍රදේශයේ ඇති රැළි බිම් ප්‍රදේශය තුළ කුඩා ප්‍රමාණයේ කඳුගැට කිහිපයක්ද දක්නට ලැබෙන අතර අඩි 799ක් උසැති කපරැල්ල කන්ද උසම ස්ථානය වේ.

රතු දුඹුරු පස් හා දියළු පස ප්‍රදේශයේ ප්‍රධානතම පස් කාණ්ඩ අතරට අයත් වේ. සමහර ප්‍රදේශ වල සුළු වශයෙන් තිරුවනා නිධි දක්නට ලැබේ. සුළු වශයෙන් කළු ගල් නිධි ද පිහිටා ඇති අතර ඒ අනුව තිරුවනා, කළු ගල් හා මැටි මෙහි ඇති ප්‍රධානතම ඛනිජ සම්පත් වේ.

ශුෂ්ක ප්‍රදේශයේ සිට තෙත් කලාපය දක්වා විවිධත්වයක් ගන්නා දේශගුණික කලාපයකට අයත් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වියලි කලාපීය දේශගුණික රටාවකට උරුමකම් කියයි.

දීප්තිමත් සූර්යලෝකයක් සහිත මෙම ප්‍රදේශයේ වාතයේ ආර්ද්‍රතාවය ඉතා ඉහළ මට්ටමක පවතී. මාර්තු, අප්‍රේල්, අගෝස්තු හා සැප්තැම්බර් යන මස වල ඉතා තදින් සූර්යාලෝකය පවතින අතර එම මාස වලදී අධික උෂ්ණත්වයක් පවතී. දෙසැම්බර්, ජනවාරි මාසවලදී උෂ්ණත්වය පහල යාමක් දක්නට ලැබේ. ඒ අනුව හිරු රැස් තදින් පතිත වන කාලයේ සාමාන්‍ය මාසික උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 31.1ක් පමණ වන අතර දෙසැම්බර්, ජනවාරි වන විට එය සෙන්ටිග්‍රේට් අංශක 22.7ක් දක්වා පහළ බසී.

අතීතයේ පෙර රජදරුවන්ගේ ඇල්ම බැල්ම මත ඉදි වූ ඓතිහාසික සිද්ධස්ථාන බල ප්‍රදේශයේ ගැමි ජනතාවගේ අධ්‍යාත්මික ගුණ වගාව වැඩි දියුණු කිරීමට ඉවහල් වී ඇත. ඓතිහාසික වටිනාකම් වලින් යුත් සිද්ධස්ථාන අතුරින් ප්‍රධාන ස්ථානය ගෙන ඇත්තේ බෞද්ධයාගේ මුදුන් මල්කඩක් බඳු දන්ත ධාතූන් වහන්සේගේ ස්පර්ශය ලද කසාගල රජමහා විහාරයයි. නුවර යුගයට අයත් වන මෙම විහාරස්ථානයේ පැරණි විහාරයේ ඇති බිතු සිතුවම් කෙරෙහි වර්තමානයේ දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ගේත් නෙත් සිත් යොමු වී ඇත.

කෘෂිකාර්මික ජීවන රටාවකට හිමිකම් කියන මෙහි වැවයි දාගැබයි කෙතයි කේන්ද්‍ර කොට ගනිමින් ගම්මාන බිහි වී ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වැව් රාශියක් පිහිටා ඇති අතර, සියපතින් සුසැදි මනරම් වැව් ප්‍රදේශයට සෞන්දර්යයත්, සිසිලසත් මෙන්ම කෘෂිකර්මාන්තයේ දියුණුවට ද ඉවහල් වේ. මෙහි පිහිටි වැව් අතරින් විශාලම වැව මැටිගත්වල වැවයි. එකිනෙක බැඳී තිබූ වැව් පද්ධති මඟින් අතීතයේදී කෙත්වතු පෝෂණය කළ අතර අඩ සියවසක සිට වලවේ, මහවැලි ජලය හා මුරුතවෙල ආදී ව්‍යාපරවලින් කෙත්වතු සරු සාර කරනු ලබයි.

අතීතයේ සිටම වී වගාව, හේන් ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කරගත් ජනතාව එතැකින් සීමා නොවී වෙනත් බෝග වගාවන්ට මෙන්ම සත්ව පාලදනයටද හුරු වී ඇත.

ඒ අනුව පළතුරු වගාව, එළවළු වගාවද මෙම බල ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ. වම්බටු, වැටකොළු, පතෝල, කරවිල, බටු, මිරිස්, බණ්ඩක්කා හා මෑ කරල් ඇතුළු බොහෝ එළවළු වර්ග සහ කෙසෙල්, අඹ, දිවුල්, දෙළුම්, බෙලි, ගස්ලබු වැනි බොහෝ පළතුරු වර්ගද මෙම ප්‍රදේශය තුළ බහුල වේ.

මීට අමතරව රසයෙන් ගුණයෙන් වැඩි මී කිරි නිෂ්පාදනයද තවත් බොහෝ පිරිසකගේ ජීවනෝපාය මාර්ගය වී ඇත.

මෑත කාලය වන විට බොහෝ ජීවන මාර්ග බිහි වී තිබුණද අතීතයේ පැවති කුරහන් සුවඳ ගැමි හදවත් තුළ තවමත් බැහැර වී නැත. මෙම ප්‍රදේශයේ හේන් ගොවිතැනටද ඇළුම් කරන බොහෝ පිරිසක් වර්තමානයේද සිටින බැවින් කුරහන්, බඩ ඉරිඟු, තල වැනි ධාන්‍ය වර්ගද බහුලව ඇත.

ස්වයං රැකියාව තම ජීවනෝපාය මාර්ගය කරගත් බොහෝ දෙනා කොහු කර්මාන්තය, ඉදල් කර්මාන්තය වැනි ක්ෂේත්‍ර වලද නියැලී සිටී.

තාක්ෂණයේ දියුණුවත් සමඟ අනාගත ලෝකයට පා නගන්නට සැරසෙන පුංචි මල් කැකුළු වන් ළමා පරපුර ද ආධ්‍යාත්මික ගුණ වගාවෙන් හා අධ්‍යාපන, සෞන්දර්යය, ක්‍රීඩා කෞශල්‍ය වලින් පරිපූර්ණ වීම බල ප්‍රදේශයේ භාග්‍යකි.

සොබා දහමේ ආශිර්වාදයත් සමඟ ලත් සොබා සෞන්දර්යය හා සිසිලසත්, ගොවියාගේ දහදියත් මුසුව හෙට දිනයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සශ්‍රීකත්වයෙන් හා සංවර්ධනයෙන් ඉදිරියට යනු නොඅනුමානය.

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මූලික තොරතුරු

- දිස්ත්‍රික්කය - හම්බන්තොට
- මැතිවරණ කොට්ඨාශය - හම්බන්තොට
- ඡන්ද කොට්ඨාසය - තංගල්ල
- පළාත් පාලන ආයතනය - අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
- කුඩා ගම්මාන - 108
- ග්‍රාම නිලධාරී වසම් - 51
- විශාලත්වය - වර්ග කිලෝ මීටර් 173.06
- වාර්ෂික වර්ෂාපතනය - මිලි මීටර් 50 - 75
- වාර්ෂික උෂ්ණත්වය - සෙල්සියස් අංශක 26 -31
- පොලිස් බල ප්‍රදේශ - අඟුණකොළපැලැස්ස, මිද්දෙනිය, වීරකැටිය, හුංගම
- ගොවිජන කේන්ද්‍ර - අඟුණකොළපැලැස්ස, උඩයාල
- රෝහල් - අඟුණකොළපැලැස්ස, කාරියමඩිත්ත, හකුරුවෙල
- මධ්‍යම බෙහෙත් ශාලා - අබේසේකරගම
- පාසල් - 23
- පෙර පාසල් - 40 (සභාව විසින් පාලනය කෙරෙන පෙරපාසල් 2කි)
- ළමා උද්‍යාන - 01
- දහම් පාසල් - 30
- විහාරස්ථාන - 36
- හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශ- 2
- බැංකු - 10
- තැපැල් කාර්යාල - 04
- ප්‍රජාශාලා - 68
- ක්‍රීඩා පිටි - 26
- වැව් - 105

# ග්‍රාම නිළධාරී වසම්

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිළධාරී වසම් හා ඊට අයත් ගම්මාන පහත දක්වා ඇත.

| අනු අංකය | වසම් අංකය | වසමේ නම | ගම්මාන ගණන | ගම්වල නම් |
|---|---|---|---|---|
| 01 | 187 | අඟුණකොළපැලැස්ස | 02 | හැඩකැටිය , අඟුණකොළපැලැස්ස |
| 02 | 188 | ආචාරියගම | 01 | ආචාරියගම |
| 03 | 189 | යකාගල | 01 | යකාගල |
| 04 | 190 | අළුත්වැව | 01 | අළුත්වැව |
| 05 | 191 | කංකානම්ගම | 02 | කංකානම්ගම , මුලනගොඩ |
| 06 | 192 | බිංකම | 02 | බිංකම , හිංආර |
| 07 | 193 | හැලේකඩ | 03 | හැලේකඩ/දකුණ , කරගහවල (කොටසක්) |
| 08 | 194 | දංදෙනිගම | 03 | හැලේකඩ, දංදෙනිගම, කුලසිංගම, පලුගහවල |
| 09 | 195 | කරගහවල | 02 | කරගහවල, සියඹලාගස්වැව |
| 10 | 196 | ජූලමුල්ල | 03 | ජූලමුල්ල, දෙපැලමුල්ල, තුප්පහිගම |
| 11 | 197 | ජඳුර | 03 | ජඳුර , නින්දගම , තුප්පහිගම (කොටසක්) |
| 12 | 198 | පහලගම | 05 | පහලගම , තෙරුන්ගම , මාගම්යාගම , මනම්පේරිගම , කුලසිංගම |
| 13 | 199 | ගුරුවල | 03 | ඉහළගුරුවල , පහළ ගුරුවල , දංදෙනිගම(කොටසක්) |
| 14 | 200 | ඉඳිගැටවෙල | 02 | ඉඳිගැටවෙල , තලම්පෝරුව(කොටසක්) |
| 15 | 201 | තලම්පෝරුව | 02 | තලම්පෝරුව , දික්කුඹුර |
| 16 | 202 | ගුරුන්නැහේගෙආර | 02 | ගුරුන්නැහේගෙආර , ගෝයිම්බරගම |
| 17 | 203 | දහඅමුණ | 02 | දහඅමුණ , දහඅට කොළණිය |
| 18 | 204 | කොටවාය | 03 | කොටවැය , පිංවැව , දහඅමුණ (කොටසක්) |
| 19 | 205 | හකුරුවෙල | 02 | හකුරුවෙල , මොදරමොටාවිල |
| 20 | 206 | නෙටොලපෝරුව | 01 | නෙටොලපෝරුව |
| 21 | 207 | උඩයාල | 03 | උඩයාල , හුන්නකුඹුර , ඇතිනිගම්වල |
| 22 | 208 | මැදයාල | 02 | මැදයාල , හුන්කුඹුර (කොටසක්) |
| 23 | 209 | බෝගමුව | 02 | බෝගමුව , ලග්ගමුව |
| 24 | 210 | වීරගස්වැව | 03 | වීරගස්වැව , ලියන්කටුව , දූන්හේන්ආර |
| 25 | 211 | හින්බුන්න | 02 | හින්බුන්න , හින්ආර |
| 26 | 212 | මකුළදෙනිය | 02 | මකුලදෙනිය , හින්බුන්න (කොටසක්) |
| 27 | 213 | මැදගොඩ | 02 | කුඹුක්මුල්ල , මැදගොඩ |
| 28 | 214 | දිඹුල්ගොඩ | 01 | දිඹුල්ගොඩ |

| අනු අංකය | වසම් අංකය | වසමේ නම | ගම්මාන ගණන | ගම්වල නම් |
|---|---|---|---|---|
| 29 | 215 | ගජනායකගම | 05 | ගජනායකගම , පිල්ලවෙල, මරක්කලයාගම, ගමඇතිගම , වේහැලිගම |
| 30 | 216 | වකමුල්ල | 02 | ඉහළ වකමුල්ල , පහළ වකමුල්ල |
| 31 | 217 | අත්තනයාල බටහිර | 01 | අත්තනයාල / බටහිර |
| 32 | 218 | අත්තනයාල / නැ | 02 | අත්තනයාල , පංගම්විල |
| 33 | 219 | දෙබොක්කාව උතුර | 01 | දෙබොක්කාව/උතුර කොටස |
| 34 | 220 | දෙබොක්කාව දකුණ | 01 | දෙබොක්කාව/දකුණ කොටස |
| 35 | 221 | සූරියපොකුණ | 04 | සූරියපොකුණ , කරගහවල , බැද්දෙවැව, බුවැලිආර |
| 36 | 222 | අමරතුංගම | 03 | අමරතුංගම , විජේසිංගම , අතපත්තුගම |
| 37 | 223 | මැදආර | 01 | මැදආර |
| 38 | 224 | කොහොඹගස්වැව | 02 | කොහොඹගස්වැව , ගල්වැව |
| 39 | 225 | උස්වැව | 01 | උස්වැව |
| 40 | 226 | කයිලවැල්පෝටාව | 01 | කයිලවැල්පෝටාව |
| 41 | 227 | මැටිගත්වල | 02 | තෝරගල , මැටිගත්වල |
| 42 | 228 | අබේසේකරගම | 01 | අබේසේකරගම |
| 43 | 229 | දික්වැව | 02 | දික්වැව , වරායාය |
| 44 | 230 | කලවැල්වල | 01 | කලවැල්වල |
| 45 | 231 | කැන්දකැටිය | 02 | ඉහළ කැන්දකැටිය , කිවුල |
| 46 | 232 | රත්මල්වල | 03 | රත්මල්වල , කච්චිගල , තඹලපැලැස්ස |
| 47 | 233 | දබරැල්ල උතුර | 03 | දබරැල්ල(කොටසක්) , ගලගාවගොඩ , වෙලගාවතුගොඩ |
| 48 | 234 | දබරැල්ල දකුණ | 02 | දබරැල්ල(කොටසක්) , කරමැටිය |
| 49 | 235 | කරමැටිය | 01 | කාරියමඩිත්ත |
| 50 | 236 | තලාව උතුර | 04 | අළුත්වැවගොඩ , වර්ණසිංගොඩ , මහළිඳගොඩ , තලාව(කොටසක්) |
| 51 | 237 | තලාව දකුණ | 05 | විරෝධාගම, කළුවගස්යාය, සමරසිංගොඩ, වැලිනගේවෙල , තලාව (කොටසක්) |

## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග තොරතුරු

| අනු අංකය | වර්ගීකරණය | මාර්ගයේ නම | දුර කි.මී. |
|---|---|---|---|
| 01 | මාර්ග සංවර්ධන අධිකාරිය | රන්න අඟුණකොළ වැටිය මාර්ගය | 16.6 |
| 02 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | හුංගම මිද්දෙනිය මාර්ගය | 24. 6 |
| 03 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | තලාව දබරැල්ල මාර්ගය | 6. 0 |
| 04 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | දෙබොක්කාව වීරකැටිය මැදමුලන මාර්ගය | 6. 5 |
| 05 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | කලවැල්වල කච්චිගල්ආර අබේසේකරගම ඇඹිලිපිටිය මාර්ගය | 4. 9 |
| 06 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | අළුත්වැව උඩයාල වීරකැටිය මාර්ගය | 18. 4 |
| 07 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | බිංකම රත්මල්වල මාර්ගය | 15. 3 |
| 08 | ප්‍රාදේශීය සභා මාර්ග | | 493 |

## පොලිස් බලප්‍රදේශය අනුව ග්‍රාම නිළධාරී වසම්

| වසම් අංකය | වසමේ නම | පොලිස් බලප්‍රදේශය |
|---|---|---|
| 187 | අඟුණකොළපැලැස්ස | අඟුණකොළපැලැස්ස |
| 188 | ආචාරියගම | අඟුණකොළපැලැස්ස |
| 189 | යකාගල | අඟුණකොළපැලැස්ස |
| 190 | අළුත්වැව | අඟුණකොළපැලැස්ස |
| 191 | කංකානම්ගම | අඟුණකොළපැලැස්ස |
| 192 | බිංකම | අඟුණකොළපැලැස්ස |
| 193 | හැලේකඩ | අඟුණකොළපැලැස්ස |
| 194 | දංදෙනිගම | අඟුණකොළපැලැස්ස |
| 195 | කරගහවල | අඟුණකොළපැලැස්ස |
| 196 | ජූලමුල්ල | අඟුණකොළපැලැස්ස |
| 197 | ජුදුර | අඟුණකොළපැලැස්ස |
| 198 | පහලගම | අඟුණකොළපැලැස්ස |
| 199 | ගුරුවල | අඟුණකොළපැලැස්ස |
| 200 | ඉඳිගැටවෙල | හුංගම |
| 201 | තලම්පෝරුව | හුංගම |
| 202 | ගුරුන්නැහේගෙආර | හුංගම |
| 203 | දහඅමුණ | හුංගම |
| 204 | කොටවාය | හුංගම |
| 205 | හකුරුවෙල | වීරකැටිය |
| 206 | නෙටොලපෝරුව | වීරකැටිය |
| 207 | උඩයාල | වීරකැටිය |
| 208 | මැදයාල | වීරකැටිය |
| 209 | බෝගමුව | වීරකැටිය |
| 210 | වීරගස්වැව | වීරකැටිය |
| 211 | හින්බුන්න | වීරකැටිය |
| 212 | මකුළදෙනිය | වීරකැටිය |
| 213 | මැදගොඩ | වීරකැටිය |
| 214 | දිඹුල්ගොඩ | වීරකැටිය |
| 215 | ගජනායකගම | වීරකැටිය |
| 216 | වකමුල්ල | වීරකැටිය |

| වසම් අංකය | වසමේ නම | පොලිස් බලප්‍රදේශය |
|---|---|---|
| 217 | අත්තනයාල බටහිර | වීරකැටිය |
| 218 | අත්තනයාල නැගෙනහිර | වීරකැටිය |
| 219 | දෙබොක්කාව උතුර | මිද්දෙණිය |
| 220 | දෙබොක්කාව දකුණ | මිද්දෙණිය |
| 221 | සූරියපොකුණ | මිද්දෙණිය |
| 222 | අමරතුංගම | අගුණකොළපැලැස්ස |
| 223 | මැදආර | අගුණකොළපැලැස්ස |
| 224 | කොහොඹගස්වැව | අගුණකොළපැලැස්ස |
| 225 | උස්වැව | අගුණකොළපැලැස්ස |
| 226 | කයිලවැල්පෝටාව | අගුණකොළපැලැස්ස |
| 227 | මැටිගත්වල | අගුණකොළපැලැස්ස |
| 228 | අබේසේකරගම | අගුණකොළපැලැස්ස |
| 229 | දික්වැව | අගුණකොළපැලැස්ස |
| 230 | කලවැල්වල | අගුණකොළපැලැස්ස |
| 231 | කැන්දකැටිය | මිද්දෙණිය |
| 232 | රත්මල්වල | මිද්දෙණිය |
| 233 | දබරැල්ල උතුර | මිද්දෙණිය |
| 234 | දබරැල්ල දකුණ | මිද්දෙණිය |
| 235 | කරමැටිය | මිද්දෙණිය |
| 236 | තලාව උතුර | මිද්දෙණිය |
| 237 | තලාව දකුණ | මිද්දෙණිය |

# සම්බන්ධීකරණ තොරතුරු



ලිපිනය - අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව, අඟුණකොළපැලැස්ස



විද්‍යුත් තැපැල - angupelessaps@gmail.com




වෙබ් - www.angunakolapelessa.ps.gov.lk



ෆැක්ස් - 047 - 2229022



දුරකතන අංක -

*කාර්යාලය* - 047 - 2228275

*ලේකම්තුමිය* - 071 – 4408452




# අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සංවිධාන ව්‍යූහය

# සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු
## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | ස්ථිර | අනියම් /ආදේශක |
| 1 | ලේකම් | 01 | - | |
| 2 | සංවර්ධන නිළධාරි | 09 | 09 | |
| 3 | තාක්ෂණ නිළධාරි | 01 | 01 | |
| 4 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 | 05 | |
| 5 | පුස්තකාලයාධිපති | 01 | - | |
| 6 | ආදායම් පරිපාලක | 01 | 01 | |
| 7 | පෙර පාසල් ගුරු | 02 | 02 | |
| 8 | රියදුරු | 06 | 05 | |
| 9 | යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 | |
| 10 | විදුලි කාර්මික | 01 | 01 | |
| 11 | කාර්යාල කාර්ය සහායක | 01 | 01 | |
| 12 | මුරකරු | 02 | 02 | |
| 13 | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු | 12 | 13 | 01 |
| 14 | පුස්තකාල සහායක | 03 | 05 | |
| 15 | සෞඛ්‍ය කම්කරු | 07 | 09 | 01 |
| 16 | රිය සහායක | - | 01 | |
| 17 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | - | |
| 18 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | - | |
| | එකතුව | 56 | 56 | 02 |

## ආයතනය යටතේ පාලනය වන භෞතික සම්පත් සහ ආයතන

### භෞතික සම්පත්

| | |
|---|---|
| • කාණු දිග අඩි | 2525 |
| • පොදු වැසිකිළි | 04 |
| • සුසාන භූමි | 45 |
| • තාර දැමූ මාර්ගය දිග කි.මී.20 | 35 |
| • බොරළු දැමූ මාර්ග දිග කි.මී. | 345 |
| • කොන්ක්‍රීට් දැමූ මාර්ග දිග කි.මී. | 148 |
| • සතිපොළ | 02 |
| • වීථි ලාම්පු | 750 |
| • නළ ළිං | 79 |
| • විදුලියෙන් ක්‍රියා කරන මෝටර් සහිත නළ ළිං | 02 |

### ආයතන

| | |
|---|---|
| • මහජන පුස්තකාල | 03 |
| • විද්‍යුත් පුස්තකාල | 01 |
| • ළමා උද්‍යාන | 07 |
| • ළදරු පාසල් | 02 |
| • නගර ශාලා | 01 |

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

# සභාව සතු වාහන

| | |
|---|---|
| 01. කැබ් රථ | 2 |
| 02. රෝද හතර ට්‍රැක්ටර් | 4 |
| 03. ලීටර් 4000 බවුසර් | 4 |
| 04. මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර | 2 |
| 05. පුද්ගල ඔසවන | 1 |
| 06. ලීටර් 5000 ලොරි බවුසර් | 1 |
| 07. ත්‍රීවිල් රථ | 1 |
| 08. අත් ට්‍රැක්ටර් | 1 |
| 09. ජීප් රථ | 1 |
| 10. ඩම්ප් ට්‍රක් | 1 |
| 11. කෘ කැබ් | 1 |


260
MASSEY FERGUSON


LANKA ASHOK LEYLAND
IVECO





















## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## ආදායම් විශ්ලේෂණය

| Angunakolapelessa Pradeshiya Sabha / 2016 Budget Summary | | |
|---|---|---|
| **Budget Summary** | **Rs** | **Rs** |
| Recurrent revenue | 44 116 000.00 | |
| Capital Revenue | 2 000 000.00 | |
| | | **46 116 000.00** |
| Recurrent Expenditure | 39 615 000.00 | |
| Capital Expenditure | 6 500 000.00 | |
| | | **46 115 000.00** |
| Surplus | | 1 000.00 |
| **Capital Expenditure Sources** | | |
| Council Revenue | | 4 500 000.00 |
| Govt/Provincial Grants | | 2 000 000.00 |
| | | **6 500 000.00** |









Note : 2016 Revenue data only up to month of ජූලි

| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| **Own Revenue Budget** | (Rs.Milions) | 14.45 | 17.94 | 18.14 | 16.20 | 16.03 |
| **Own Revenue Actual** | (Rs.Milions) | 15.30 | 14.15 | 14.36 | 13.21 | 11.57 |

Angunakolapelessa Pradeshiya Sabha / 2016 Collection Efficiency % Own Revenue




Angunakolapelessa Pradeshiya Sabha / 2016 Graph of Employ Analysis
20
15
10
5
0
17
16
0
0
No of temporary staff hired per month
No of population served by one staff (all available)
Average Budget
Average Actual


Angunakolapelessa Pradeshiya Sabha / 2016 Graph 1 of Per Property Analysis
Rs. M 2000
Rs. M 1500
Rs. M 1000
Rs. M 500
Rs. M 0
1786
1281
290
445
1496
836
Total Exp.
Total Exp. By Own Revenue
Total Exp. Through Revenue Grants
Average Budget
Average Actual

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## පසුගිය වර්ෂ 5 ක වියදම් විශ්ලේෂණය (සත්‍ය) වියදම් විශ්ලේෂණය

| වැය ශීර්ෂය<br>පුනරාවර්තන වියදම් | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 10622975 | 11746251 | 13646763 | 17197980 | 24490103 |
| 02. ගමන් වියදම් | 346237 | 273010 | 285547 | 1045157 | 314691 |
| 03. සැපයුම් හා උපකරණ | 2960636 | 4275176 | 4253379 | 5212105 | 2783007 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 2246606 | 1362163 | 2173136 | 3940163 | 4069999 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා, අවශ්‍යතා හා වෙනත් සේවා | 2066825 | 1152050 | 1681898 | 1661779 | 2256141 |
| 06. පොලී ගෙවීම්,ලාභාංශ හා ප්‍රසාද මුදල් | 206840 | 1324477 | 0 | 113166 | 110570 |
| 07. ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 329770 | 123160 | 329060 | 344084 | 684316 |
| 08. විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 300033 | 280862 | 195750 | 261503 | 67700 |
| ***පුනරාවර්තන වියදම් එකතුව*** | ***19079922*** | ***20537149*** | ***22565533*** | ***29775937*** | ***34776527*** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | | |
| 80.ප්‍රාග්ධන වියදම | 162247182 | 106760221 | 82496362 | 101602003 | 29515499 |
| ***ප්‍රාග්ධන වැය එකතුව*** | ***162247182*** | ***106760221*** | ***82496362*** | ***101602003*** | ***29515499*** |
| **පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් එකතුව** | **181327104** | **127297370** | **105061895** | **131377940** | **64292026** |






# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාව

## පසුගිය වර්ෂ 5 ක ආදායම් විශ්ලේෂණය (සත්‍ය)

| ආදායම් ශීර්ෂය<br>පුනරාවර්තන ආදායම් | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| 10. වරිපනම් හා බදු | 137925 | 101700 | 205135 | 263550 | 267335 |
| 20. කුලී | 10206852 | 9834769 | 9251845 | 9452433 | 8277130 |
| 30. බලපත්‍ර ගාස්තු | 508083 | 504087 | 624227 | 958555 | 1116749 |
| 40. සේවා සඳහා ගාස්තු | 1803222 | 703545 | 929198 | 534215 | 791520 |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ | 2082042 | 3272300 | 1295862 | 1476549 | 1445699 |
| 60. වෙනත් ආදායම් | 930372 | 886501 | 1848689 | 1679492 | 1307135 |
| 70. පුනරාවර්තන ආධාර | 7741942 | 7896414 | 9488544 | 13878026 | 24478664 |
| ***පුනරාවර්තන ආදායම් එකතුව*** | ***23410438*** | ***23199315*** | ***23643499*** | ***28242819*** | ***37684231*** |
| **ප්‍රාග්ධන ලැබීම්** | | | | | |
| 80.ප්‍රාග්ධන ලැබීම් | 136608955 | 106760221 | 81026507 | 102911842 | 29361629 |
| ***ප්‍රාග්ධන ලැබීම් එකතුව*** | ***136608955*** | ***106760221*** | ***81026507*** | ***102911842*** | ***29361629*** |
| ***පුනරාවර්තන හා ප්‍රාග්ධන ලැබීම් එකතුව*** | ***160019393*** | ***129959536*** | ***104670006*** | ***131154661*** | ***67045860*** |






# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම සහ සත්‍ය වියදම

| වියදම් ශීර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | | |
| 01. වැටුප් හා දීමනා | 13,338,000 | 24,490,103 |
| 02. ගමන් වියදම් | 362,000 | 314,691 |
| 03. සැපයුම් හා උපකරණ | 3,772,000 | 2,783,007 |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 2,215,000 | 4,069,999 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 977,000 | 2,256,141 |
| 06. පොලී ගෙවීම් හා ලාභාංශ | 1,255,000 | 110,570 |
| 07. ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 356,000 | 684,316 |
| 08. විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 395,000 | 67,700 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **22,670,000** | **34,776,526** |



# පුනරාවර්තන වියදම්
## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම සහ සත්‍ය වියදම(ඔක්තෝබර් දක්වා)

| වියදම් ශීර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| 01. වැටුප් හා දීමනා | 28,947,000 | 20,707,438 |
| 02. ගමන් වියදම් | 888,000 | 249,406 |
| 03. සැපයුම් හා උපකරණ | 4,123,000 | 3,231,394 |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 1,510,000 | 1,519,200 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 2,106,000 | 1,253,596 |
| 06. පොලී ගෙවීම් හා ලාභාංශ | 1,267,000 | - |
| 07. ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 700,000 | 231,241 |
| 08. විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 74,000 | 33,482 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **39,615,000** | **27,225,756** |



# අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## අයවැය සාරාංශය 2017

| | | | රු. | රු. |
|---|---|---|---|---|
| පුනරාවර්තන ආදායම් | | | | |
| | පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | | 18,411,500 | |
| | සෞඛ්‍ය සේවා | | 4,211,000 | |
| | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | | 10,132,300 | |
| | වෙනත් උපයෝගී සේවා | | 10,297,500 | |
| | සුභ සාධක සේවා හා විහරණ | | 6,555,500 | 49,607,800 |
| | | | | |
| ප්‍රාග්ධන ආධාර | | | | |
| | මන්ත්‍රී ප්‍රතිපාදන | | 1,000,000 | |
| | පළාත් නිශ්චිත | | 11,200,000 | |
| | නභාසිටුවීමේ ව්‍යාපෘතිය | | 1,600,000 | 13,800,000 |
| | | | | 63,407,800 |
| | | | | |
| පුනරාවර්තන වියදම් | | | | |
| | පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | | 18,700,900 | |
| | සෞඛ්‍ය සේවා | | 6,868,500 | |
| | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | | 10,267,200 | |
| | වෙනත් උපයෝගී සේවා | | 4,276,200 | |
| | සුභ සාධක සේවා හා විහරණ | | 6,512,000 | 46,624,800 |
| | | | | |
| ප්‍රාග්ධන වියදම් | | | | |
| | පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | | 160,000 | |
| | සෞඛ්‍ය සේවා | | 10,000,000 | |
| | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | | 5,520,000 | |
| | වෙනත් උපයෝගී සේවා | | 600,000 | |
| | සුභ සාධක සේවා හා විහරණ | | 500,000 | 16,780,000 |
| | | | | 63,404,800 |
| අතිරික්තය | | | | 3,000 |
| | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය | | | | |
| | සභා අරමුදල් | | | 2,980,000 |
| | රාජ්‍ය/පළාත් සභා අරමුදල් | | | 13,800,000 |
| | | | | 16,780,000 |

## වැඩසටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා

මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

| | | |
|---|---|---|
| ව්‍යාපෘති අංක 01 | - | පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා |
| ව්‍යාපෘති අංක 02 | - | මූල්‍ය කටයුතු |
| ව්‍යාපෘති අංක 03 | - | තක්සේරු කිරීම් හා ආදායම් එකතු කිරීම |
| ව්‍යාපෘති අංක 04 | - | අභ්‍යන්තර විගණනය |
| ව්‍යාපෘති අංක 05 | - | කාර්යය මණ්ඩල අභිප්‍රේරණය |
| ව්‍යාපෘති අංක 06 | - | කාර්යය මණ්ඩල පුහුණු කිරීම |

### ව්‍යාපෘති අංක 01 - පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා

මේ යටතේ සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල, කාර්යය හා යුතුකම් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී පනවනු ලබන ප්‍රතිපත්ති හා තීරණ නිසියාකාරව, අප්‍රමාදව හා අර්ථවත්ව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීමෙක් අපේක්ෂා කරනු ලබයි. එම අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා,

1. සභාපති හා සභිකයින්ගේ පාලනය සඳහා ලේකම් සේවාව සැපයීම.
2. සභාවේ රැස්වීම් පිළියෙල කිරීම හා වාර්තා පවත්වාගෙන යාම.
3. ලේඛනාගාරය පවත්වාගෙන යාම සහ සභාවේ ලිපිගොනු, වාර්තා හා වෙනත් ලිපි ලේඛණ සුරක්ෂිතව තබා ගැනීම.
4. සේවක මණ්ඩල පාලනය, විශ්‍රාම වැටුප් හා අනෙකුත් පාලන කටයුතු.
5. සභාවේ සියළුම පරිපාලනමය හා විධායක කාර්යයන් නියම කිරීම, විධිමත් කිරීම හා පරිලෝචනය කිරීම.
6. සභාවේ සෑම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකය වශයෙන් කටයුතු කිරීම.
7. ප්‍රාදේශීය සභාවේ දේපළ ආරක්ෂාව හා භාරකාරත්වය නිසැක කිරීමට ක්‍රමයන් ඇති කිරීම.

### ව්‍යාපෘති අංක 02 - මූල්‍ය කටයුතු

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය නම් මූල්‍ය පාලනයයි. සභාවේ සියළුම මූල්‍ය කටයුතු ඉටුකිරීම, පාලනය කිරීම හා ඒකාබද්ධ කිරීම ප්‍රධානතම කාර්යය වේ. භාවිතය සඳහා අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් තොග ගබඩා අවශ්‍ය වන්නේ නම් ඒවා පවත්වාගෙන යාමේ හා පාලනය කිරීම් ආදී කටයුතු ඉටු කිරීම කරනු ලබයි. මේ යටතේ සිදුවන සේවාවන් පහත පරිදි විග්‍රහ කළ හැකිය.

1. අයවැය ලේඛනය පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා සැපයීම.
2. ආදායම් ප්‍රතිපත්ති හා මුදල් සැපයුම් පරිපාලනය කිරීම.
3. ප්‍රාදේශීය සභා අරමුදල් පාලනය කිරීම.
4. ආදායම් හා වෙනත් ලැබීම් පිළිබඳ මධ්‍යගත පාලනය.
5. ගිණුම්ගත කිරීමේ ක්‍රම, කාර්යය සංවිධානය හා පාලන ක්‍රම ගිණුම් පොත් පවත්වාගෙන යාම හා ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම.
6. බඩු භාහිරාදිය මිළදී ගැනීම, එහි භාරකාරත්වය, ගෙවීම, බෙදා හැරීම පිළිබඳ මධ්‍යගත පාලනය, කාර්යය මණ්ඩල වැටුප් හා පාරිශ්‍රමික දීමනා පිළියෙල කිරීම හා ගෙවීම් කිරීම.

## ව්‍යාපෘති අංක 03 - තක්සේරු කිරීම හා ආදායම් එකතු කිරීම

මෙම අංශයට අයත් කාර්යය නම් නීතිමය විධි විධාන අනුව ප්‍රාදේශීය සභා ආදායම් අප්‍රමාදව හා ක්‍රමවත්ව එකතු කර ගැනීම සඳහා ගත යුතු සෑම පියවරක්ම ගැනීමට ක්‍රියා කරනු ලබන අතර, ඒ පිළිබඳ ලිපි ලේඛන පවත්වාගෙන යාම හා සභාවට ආදායම් වැඩිදියුණු කර ගන්නා මාර්ගයන් සොයා බැලීම හා අවශ්‍ය නීති සම්පාදනය කිරීම වෙනුවෙන් ක්‍රියා කරනු ඇත.

## ව්‍යාපෘති අංක 04 - අභ්‍යන්තර විගණනය

මෙම අංශයේ කාර්යයන් නම් බදු ගෙවන්නෝ සහ සභාව වෙනුවෙන් පරිපාලනයේ සෑම අංශයක්ම පිරික්සීම හා විමර්ශනයට භාජනය කිරීමයි. පහත සඳහන් කාර්යයන් මෙහි ප්‍රධාන කොට සැලකිය හැකිය.

1. ප්‍රාදේශීය සභාවේ අරමුදලට ලැබිය යුතු මුදල් නිසියාකාරව අයකරනු ලබන බව සොයා බැලීම.
2. වැරදි සහ වංචනික ක්‍රියා වැළැක්වීම සඳහා සියළුම ගිණුම් ඒකකයන් සම්බන්ධයෙන් කරනු ලබන අභ්‍යන්තර ගිණුම් විගණනය සාර්ථක ලෙස කිරීම.
3. භාණ්ඩ පරිහරණය සහ කම්කරු ශ්‍රමය හරහැටි උපයෝගී කරගන්නේ දැයි සොයා බැලීම.
4. නිදැල්ලේ ඇති සභාවේ වත්කම් නොපමාව විධිමත් භාරකාරත්වය යටතට ගැනීම හා අපතේ යන කම්කරු ශ්‍රමය හා ද්‍රව්‍ය නාස්තිය වැළැක්වීමට කටයුතු කිරීම.

## ව්‍යාපෘති අංක 05 - කාර්යය මණ්ඩල අභිප්‍රේරණය

කාර්යය මණ්ඩලය විසින් කරනු ලබන සේවාවන් අගය කිරීම, කාර්යක්ෂමව කැපවීමෙන් කරනු ලබන කාර්යයන් සඳහා ප්‍රශංසා කිරීම හා ඒ පිළිබඳ සහතික හෝ ලිපි නිකුත් කිරීම තුළ කාර්යය මණ්ඩලයේ උද්‍යෝගය වැඩිවනු ඇත. මූලික පරමාර්ථය වන්නේ මානසික මට්ටම වැඩිදියුණු කිරීම තුළින් හොඳ සේවාවක් බලාපොරොත්තු වීමයි. එමෙන්ම කාර්යය මණ්ඩලයට හිමිවිය යුතු ස්ථානය, වරප්‍රසාද හා පාරිශ්‍රමික දීමනා වෙතොත් අප්‍රමාදව හා නොපිරිහෙලා ලබාදීම තුළ කාර්යය මණ්ඩලය අභිප්‍රේරණය වනු ඇත.

## ව්‍යාපෘති අංක 06 - කාර්යය මණ්ඩල පුහුණු කිරීම

උසස්ම නිළධාරියාගේ සිට පහළ කම්කරුවා දක්වා සේවය කරනු ලබන සියළුම සේවකයින්ට තම කාර්යය කෙසේ කළ යුතුද යන්න පිළිබඳව හා ගුණාත්මක සේවාවක් ඇති කර ගැනීමේ අදහසින් සේවක පුහුණුව මෙහි අරමුණ වේ.

## වැඩසටහන් අංක 02 - සෞඛ්‍ය සේවා

මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

| | | |
|---|---|---|
| ව්‍යාපෘති අංක 01 | - | රෝග වැළැක්වීමේ සේවා |
| ව්‍යාපෘති අංක 02 | - | රෝග සුවකිරීමේ සේවා |
| ව්‍යාපෘති අංක 03 | - | ආහාර හා සනීපාරක්ෂාව |
| ව්‍යාපෘති අංක 04 | - | මළ බැහැර කිරීමේ සේවා |
| ව්‍යාපෘති අංක 05 | - | මාතෘ හා ළමා සෞඛ්‍ය |
| ව්‍යාපෘති අංක 06 | - | සෞඛ්‍ය අධ්‍යාපනය |
| ව්‍යාපෘති අංක 07 | - | කුණු කසල එකතු කිරීම |
| ව්‍යාපෘති අංක 08 | - | වෙනත් සෞඛ්‍ය සේවා (සුසාන භූමි ඇතුළුව) |

### ව්‍යාපෘති අංක 01 - රෝග වැළැක්වීමේ සේවා

ප්‍රචාරක කටයුතු මඟින් සනීපාරක්ෂක කටයුතු පරිලෝචනය කිරීම, බෝවන රෝග වසංගත හා පරිසරයේ හටගන්නා සනීපාරක්ෂාවට අහිතකර තත්වයන් නැති කිරීම හා සෞඛ්‍ය වර්ධනය ඇති කිරීම මීට අයත් වේ.

1. ලෙඩ රෝග වැළැක්වීම සඳහා නීතිරීති ක්‍රියාත්මක කිරීම, වෙළඳ ව්‍යාපාරික ස්ථාන ආදාය විධිමත් කිරීම හා විමධ්‍යගත කිරීම.
2. ජල භීතිකා රෝග නාශක ව්‍යාපාර පවත්වාගෙන යාම.
3. විෂබීජ නාශක බෙහෙත් දියකර ඉසීම.
4. මීයන් වඳ කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
5. එන්නත් කිරීම හා ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම.

### ව්‍යාපෘති අංක 02 - රෝග සුව කිරීමේ සේවා

නොමිලයේ වෛද්‍ය ප්‍රතිකාර සැලැස්වීමෙන්ද ලෙඩ රෝග සුවකර ශාරීරික සෞඛ්‍ය පුනරුත්ථාපනය කිරීමෙන් මහජන සෞඛ්‍ය වර්ධනය මෙම සේවාවන්ට අයත් කාර්යයන් වේ.

### ව්‍යාපෘති අංක 03 - ආහාර හා සනීපාරක්ෂාව

මෙම සේවාවේ ප්‍රධාන කටයුතු පහත පරිදි වේ.

1. ආහාර හා ඖෂධ පනත ක්‍රියාත්මක කිරීම හා ආහාර පිළිබඳ සෞඛ්‍ය කටයුතු වලට අයත් හෝටල්, තේ කඩ, බත්කඩ, බේකරි සහ අප්‍රිය හි අනතුරුදායක යටතේ වන අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීම.
2. ගෝ ඝාතක ආඥා පනත ක්‍රියාත්මක කිරීම

## ව්‍යාපෘති අංක 04 - මළ බැහැර කිරීමේ සේවා

ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වැසිකිලි නඩත්තු කිරීමත් ප්‍රාදේශීය ජනතාවගේ මළ බැහැර පද්ධති පවිත්‍ර කිරීමත් මෙමඟින් සිදු කෙරේ.

## ව්‍යාපෘති අංක 05 - මාතෘ හා ළමා සෞඛ්‍යය

මෙම සේවාව යටතේ ප්‍රධාන කාර්යයන් නම් ගර්භනී මව්වරුන්ගේ හා ළදරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම වේ. එයට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. පූර්ව ප්‍රසූති හා පශ්චාත් ප්‍රසූති චිකිත්සාගාරයක් පැවැත්වීම.
2. සෞඛ්‍ය නිළධාරීන් මව්වරුන්ගේ නිවෙස් වලට ගොස් සෝදිසි කිරීම හා වෛද්‍ය උපදෙස් හා ආරක්ෂාව සලසා දීම.
3. නිවෙස් වලදී සිදුවන ප්‍රසූති සඳහා පහසුකම් හා ආධාර සැපයීම.
4. දිළිඳු දරුවන්ට හා ගර්භනී මව්වරුන්ට ආහාර ඖෂධ සැපයීම.
5. බෝවන රෝග වැළැක්වීම සඳහා ළදරුවන්ට ප්‍රතිශක්තිකරණය ලබාදීම.
6. පවුල් සංවිධාන චිකිත්සාගාර පැවැත්වීම.

## ව්‍යාපෘති අංක 06 - සෞඛ්‍ය අධ්‍යාපනය

මෙම සේවාව යටතේ ප්‍රධාන කටයුතු නම් සිනමා දර්ශන මඟින් සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම හා සෞඛ්‍ය සතිය පැවැත්වීම වේ.

## ව්‍යාපෘති අංක 07 - කුණු කසල එකතු කිරීම

නගරයේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා සියළුම අපද්‍රව්‍ය එකතු කර කසළ කළමනාකරණය (පිළිසරු ව්‍යාපෘතිය) කිරීම සිදු කරනු ලැබේ.

## ව්‍යාපෘති අංක 08 - වෙනත් සෞඛ්‍ය සේවා (සුසාන භූමි ඇතුළුව)

නගරයේ සෞඛ්‍යය ආරක්ෂා වන පරිදි ප්‍රදේශයේ වැසියන්ගේ හා අනාථ මළ සිරුරු භූගත කිරීම හා ආදාහන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීම මෙම සේවාවේ අරමුණ වේ.

## වැඩසටහන් අංක 03 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් සහ ගොඩනැගිලි

ප්‍රාදේශීය සභාව සතු ඉඩම්, ගොඩනැගිලි, මංමාවත් ක්‍රමවත්ව පවත්වාගෙන යාමත්, අළුත්වැඩියාවන් හා අලුතින් එකතු කිරීමේ කටයුතුද ඇතුළුව ප්‍රාදේශීය සීමාව තුළ ඉදිකරනු ලබන ගොඩනැගිලි පිළිබඳව ක්‍රමවත් වැඩපිළිවෙලක් අනුව නගර සංවර්ධන අධිකාරිය සමඟ එකමුතුව ක්‍රියා කිරීම මෙම වැඩසටහන යටතේ සිදුවේ.

මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

- ව්‍යාපෘති අංක 01 - නගර නිර්මාණය
- ව්‍යාපෘති අංක 02 - මාර්ග, කාණු, පාලම් හා බෝක්කු නඩත්තුව
- ව්‍යාපෘති අංක 03 - ඉඩම් හා ගොඩනැගිලි
- ව්‍යාපෘති අංක 04 - මල්වතු හා උද්‍යාන

### ව්‍යාපෘති අංක 01 - නගර නිර්මාණය

මෙම ව්‍යාපෘතිය යටතේ කෙරෙන ප්‍රධාන කටයුතු නම් ගොඩනැගිලි සැලසුම් පිළිබඳ කටයුතු කිරීම හා නගර නිර්මාණ කටයුතු වේ.

### ව්‍යාපෘති අංක 02 - මාර්ග, කාණු, පාලම් හා බෝක්කු නඩත්තුව

මෙම සේවාව යටතේ ප්‍රධාන කටයුතු නම් ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි සභාව සතු සියළුම පාරවල්, පටු මංමාවත්, කාණු හා බෝක්කු, පාලම්, ඇළ දොල නඩත්තු කිරීම මෙමඟින් සිදුවේ.

### ව්‍යාපෘති අංක 03 - ඉඩම් හා ගොඩනැගිලි

මෙම සේවාවේ ප්‍රධාන කාර්යයන් නම් ප්‍රාදේශීය සභාව සතු ඉඩම් ගොඩනැගිලි නිවාස යෝජනා ක්‍රම, සාප්පු සංකීර්ණ, කඩ කාමර, පොදු වෙළඳපොල ආදිය නඩත්තු කිරීම වේ. ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පාලනය කිරීම හා විධිමත් කිරීම, ප්‍රාදේශීය සභා ඉඩම් බදු දීම ආදිය වේ.

### ව්‍යාපෘති අංක 04 - මල්වතු හා උද්‍යාන

මෙම සේවාව යටතේ වැදගත් කාර්යයන් නම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අලංකාරය පිණිස මල්වතු හා උද්‍යාන නඩත්තු කිරීම හා පාලනය කිරීම වේ.

## වැඩසටහන් අංක 05 - මහජන උපයෝගීතා සේවා

මහජන අර්ථකාරී සේවාවන් රැසක් ඉටුකරනු ලබන මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

| | | |
|---|---|---|
| ව්‍යාපෘති අංක 01 | - | වෙළඳපොලවල් |
| ව්‍යාපෘති අංක 02 | - | වීථි ආලෝක කිරීම |
| ව්‍යාපෘති අංක 03 | - | ළිං ජල, කාණු හා නාන ස්ථාන |

### ව්‍යාපෘති අංක 01 - වෙළඳපොලවල්

පොදු වෙළඳපොල කළමනාකරණය කිරීම පවත්වාගෙන යාම මෙහි ප්‍රධාන කාර්යය භාරය වේ. පාරිභෝගිකයන් හා වෙළෙන්දන් අතර, පැහැදිලි සම්බන්ධතාවක් පවත්වාගෙන යාමෙන් පාරිභෝගිකයාට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය පහසුවවෙන් මිළදී ගැනීම හා ප්‍රමිතියකින් යුක්තව ඒවා සැපයීමට හැකිවන අයුරින් එකී සම්බන්ධතාවය ගොඩනැගීම ප්‍රධාන පරමාර්ථය වේ. තවද මෙම පොදුවෙළඳ පොලවල් තුළින් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධනයක් ඇති කිරීම ද අපේක්ෂා කරනු ලබයි.

### ව්‍යාපෘති අංක 02 - වීථි ආලෝක කිරීම

මෙම සේවාවේ ප්‍රධාන කාර්යය නම් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටා ඇති සෑම විදුලි කණුවකම දැල්වෙන විදුලි බුබුලු නියමිත වේලාවට දැල්වීම සහ නිවා දැමීමත්, සුදුසු ස්ථාන වලට විදුලි බුබුළු සවිකිරීම හා ඒවා අළුත්වැඩියා කර නඩත්තු කිරීමත් වේ.

### ව්‍යාපෘති අංක 03 - ළිං, ජල කාණු හා නාන ස්ථාන

ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රසිද්ධ ළිං, ජල කාණු හා නාන ස්ථාන පවත්වාගෙන යාම හා ඒවායෙහි අළුත්වැඩියා කටයුතු ඉටුකිරීම මේ යටතේ බලාපොරොත්තු වේ.

## වැඩසටහන් අංක 06 - සුභ සාධක සේවා විහරණ

මහජන සුභසාධනය වර්ධනය කිරීමට ඉවහල් වන අයුරින් දැනුම අවබෝධය හා අන්‍යොන්‍ය එකමුතුව වර්ධනය සඳහා පහසුකම් සැලැස්වීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වේ.

මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

| | | |
|---|---|---|
| ව්‍යාපෘති අංක 01 | - | පුස්තකාල සේවා |
| ව්‍යාපෘති අංක 02 | - | ප්‍රජා මධ්‍යස්ථාන |
| ව්‍යාපෘති අංක 03 | - | පොදු ක්‍රීඩා හා විනෝද කටයුතු |
| ව්‍යාපෘති අංක 04 | - | පෙර පාසල් |

### ව්‍යාපෘති අංක 01 - පුස්තකාල සේවා

මෙම සේවාවේ ප්‍රධාන අරමුණ මහජනතාවට පොත්පත්, වාර සඟරා, පුවත්පත් ආදිය පහසුවෙන් කියවීමට, බැහැර ගෙනයාමට හා එකී කරුණු ස්ථාපිත කර ගැනීමට සුදුසු ස්ථාන පිහිටුවා පවත්වාගෙන යාමට ක්‍රියා කිරීමයි.මේ යටතේ ප්‍රාදේශීය සභාව මඟින් පාලනය කරනු ලබන සාමාන්‍ය පුස්තකාල සේවාවට අමතරව නවීන තාක්ෂණයෙන් සමන්විත විද්‍යුත් පුස්තකාල සේවාවක්ද ආරම්භ කර ඇත.

### ව්‍යාපෘති අංක 02 - ප්‍රජා මධ්‍යස්ථාන

ප්‍රජාවගේ නැතහොත් ප්‍රදේශවාසීන්ගේ සහභාගීත්වය හා අධ්‍යාත්මික ගුණධර්ම වගා කිරීමේ අරමුණින් යුතුව මෙම සේවාව අරම්භ කර ක්‍රියාත්මක කරනු ලබයි.

### ව්‍යාපෘති අංක 03 - පොදු ක්‍රීඩා හා විනෝද කටයුතු

පොදු ක්‍රීඩා හා විනෝද කටයුතු පවත්වගෙන යාමට පහසුකම් සැලසීමෙන් මහජනතාවගේ කායික හා මානසික සෞඛ්‍ය වර්ධනය සඳහා ඉඩ සැලසීම ප්‍රධාන අරමුණ කරගෙන මෙම සේවාව පවත්වාගෙන යනු ලබයි.

### ව්‍යාපෘති අංක 04 - පෙර පාසල්

ප්‍රාදේශීය සභාව විසින් පෙර පාසැල් පවත්වාගෙන යනු ලබන අතර, එමඟින් ප්‍රදේශයේ කුඩා දරුවන් වෙනුවෙන් වන බුද්ධි වර්ධනයේ ආරම්භය නිසිපරිදි සැකසීමට ක්‍රියා කරනු ලබයි.

## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## 2017 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සාරාංශය (පුනරාවර්තන)

| වියදම් ශීර්ෂය | වැඩසටහන් 01 පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | වැඩසටහන් 02 සෞඛ්‍ය සේවා | වැඩසටහන් 03 භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | වැඩසටහන් 05 පොදු උපයෝගීතා සේවා | වැඩසටහන් 06 සුභසාධක සේවා හා විහරණ | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| 01. පෞද්ගලික පඩිනඩි | 13,614,900 | 4,637,600 | 6,497,700 | 2,126,200 | 3,210,000 | 30,086,400 | 64.53% |
| 02. ගමන් වියදම් | 351,000 | 5,000 | 75,000 | 5,000 | 5,000 | 441,000 | 0.95% |
| 03. සැපයුම් හා උපකරණ | 1,210,000 | 667,000 | 1,220,000 | 785,000 | 202,000 | 4,084,000 | 8.76% |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 2,300,000 | 1,170,000 | 900,000 | 250,000 | 3,000,000 | 7,620,000 | 16.34% |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,010,000 | 167,000 | - | 965,000 | 90,000 | 2,232,000 | 4.79% |
| 06. පොලී ගෙවීම් හා ලාභාංශ | - | - | 1,076,000 | - | - | 1,076,000 | 2.31% |
| 07. ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 215,000 | 45,000 | 410,000 | 80,000 | 5,000 | 755,000 | 1.62% |
| 08. විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - | 176,900 | 88,500 | 65,000 | - | 330,400 | 0.70% |
| පුනරාවර්තන වියදම් එකතුව | **18,700,900** | **6,868,500** | **10,267,200** | **4,276,200** | **6,512,000** | **46,624,800** | **100%** |

## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## 2017 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සාරාංශය (පුනරාවර්තන)

| ආදායම් ශීර්ෂය | වැඩසටහන් 01 | වැඩසටහන් 02 | වැඩසටහන් 03 | වැඩසටහන් 05 | වැඩසටහන් 06 | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | පොදු උපයෝගීතා සේවා | සුභසාධක සේවා හා විහරණ | | |
| 10. වරිපනම් හා බදු | - | 270,000 | 10,000 | - | 30,000 | 310,000 | 0.62% |
| 20. කුලී | - | - | 3,501,000 | 8,522,500 | 40,000 | 12,063,500 | 24.32% |
| 30. බලපත්‍ර ගාස්තු | 500,200 | 290,000 | 231,300 | - | - | 1,021,500 | 2.06% |
| 40. සේවා සඳහා ගාස්තු | 5,300 | - | 325,000 | - | 90,000 | 420,300 | 0.85% |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ | 1,500,000 | - | - | 30,000 | 183,500 | 1,713,500 | 3.45% |
| 60. වෙනත් ආදායම් | 1,220,000 | 131,000 | 55,000 | 20,000 | 7,000 | 1,433,000 | 2.89% |
| 70. පුනරාවර්තන ආධාර | 15,186,000 | 3,520,000 | 6,010,000 | 1,725,000 | 6,205,000 | 32,646,000 | 65.81% |
| පුනරාවර්තන ආදායම් එකතුව | **18,411,500** | **4,211,000** | **10,132,300** | **10,297,500** | **6,555,500** | **49,607,800** | **100%** |

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## 2017 වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු සාරාංශය

| ශීර්ෂය | වැඩසටහන් 01 | වැඩසටහන් 02 | වැඩසටහන් 03 | වැඩසටහන් 05 | වැඩසටහන් 06 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | පොදු උපයෝගීතා සේවා | සුභසාධක සේවා හා විහරණ | |
| පුනරාවර්තන ආදායමෙන් පුනරාවර්තන වියදම් අඩුකළ පසු ඉතිරිය | (289,400) | (2,657,500) | (134,900) | 6,021,300 | 43,500 | 2,983,000 |
| එකතු කළා:- | | | | | | |
| ප්‍රාග්ධන ලැබීම් | | | | | | |
| 80. ප්‍රාග්ධන ආධාර | - | 10,000,000 | 3,000,000 | 600,000 | 200,000 | 13,800,000 |
| පුනරාවර්තන ඉතිරිය හා ප්‍රාග්ධන ලැබීම් එකතුව | (289,400) | 7,342,500 | 2,865,100 | 6,621,300 | 243,500 | 16,783,000 |
| අඩු කළා:- | | | | | | |
| ප්‍රාග්ධන වියදම් | | | | | | |
| 09. ප්‍රාග්ධන වියදම් | 160,000 | 10,000,000 | 4,150,000 | 600,000 | 500,000 | 15,410,000 |
| 10. ණය වාරික ආපසු ගෙවීම් | - | - | 1,370,000 | - | - | 1,370,000 |
| අතිරික්තය | (449,400) | (2,657,500) | (2,654,900) | 6,021,300 | (256,500) | 3,000 |

# 01

# පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා









## වැඩසටහන් අංක 01 යටතේ ඇස්තමේන්තු කර ඇති පුනරාවර්තන ආදායම් ප්‍රභවයන්.......

### වාහන බලපත්‍ර ගාස්තු - 1.3.35

ප්‍රාදේශීය සභා පනතේ 147(1)(අ) වගන්තිය ප්‍රකාර වාහන හා සතුන් පිළිබඳ බද්දක් අය කළ හැකි බවට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව එම පනතේ හතරවන උපලේඛනය අනුව මෙසේ අයකළ යුතු වාර්ෂික බදු ප්‍රමාණයන් නියම කර ඇත. එහි බයිසිකලයක් සඳහා අයකළ යුතු මුදල රු.4.00ක් ලෙස පෙන්වා ඇත. පසුගිය වර්ෂ කිහිපයක බයිසිකල් භාවිතය අවම වීම සැලකිල්ලට ගෙන 2017 වර්ෂයට මෙම අය විෂයය යටතේ රු.200.00ක ආදායමක් ඇස්තමේන්තු කර ඇත.

### විශේෂ ගාස්තු (ප්‍රචාරක දැන්වීම් ගාස්තු) - 1.3.36

ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය ප්‍රකාර අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය සභාව වෙත ඇත. ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්, කටවුට් හා පෝස්ටර් දැන්වීම් ආදියෙන් ගාස්තුවක් අය කිරීමට සභාව විසින් ඊට අදාල අතුරු ව්‍යවස්ථා මඟින් ප්‍රතිපාදන සලසාගෙන ඇත. මේ සඳහා අයකරනු ලබන ගාස්තු ප්රමාණයන් පහත දැක්වේ. එම ගාස්තු ප්‍රමාණයන් පදනම් කර ගෙන ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම මඟින් 2017 වර්ෂයට රු.500,000.00ක ආදායමක් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

අය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ විස්තර

1. තාවකාලික (මාස 01ට අඩු) දැන්වීම් පුවරු/බැනර් සඳහා - (වර්ග අඩියකට)රු.10.00
2. මාසයකට වැඩි ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා - (වර්ග අඩියකට)රු.50.00

### සේවා සඳහා ගාස්තු - 40

සභාව විසින් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් ගාස්තු අයකරනු ලබයි. ඒවා පහත පරිදි වේ.

1. විශේෂ ගාස්තු(වාහන බලපත්‍ර සඳහා පරිපාලන වියදම්) - 1.4.44(1)

   පාපැදි ලියාපදිංචිකිරීම වෙනුවෙන් අයකරනු ලබන පරිපාලන වියදම් - රු.6.00

   මේ වෙනුවෙන් 2017 වර්ෂයට රු.300.00ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

2. විශේෂ ගාස්තු(කර්මාන්ත වලින් පරිපාලන වියදම්) - 1.4.44(2)

   මේ වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.5000.00ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

උසාවි දඩ - 1.5.52

ප්‍රාදේශීය සභා පනත මෙන්ම වෙනත් අණපනත් ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම නීතිය ක්‍රියාත්මක වීම තුළින් උසාවිය විසින් අයකර ගන්නා වූ දඩ මුදල් වලින් ප්‍රාදේශීය සභාව වෙත ලැබේයැයි අපේක්ෂිත ආදායම උසාවි දඩ ආදායම යටතේ ඇස්තමේන්තු කර ඇත. පසුගිය වර්ෂ කිහිපයක ලැබී ඇති උසාවි දඩ ආදායම සැලකිල්ලට ගනිමින් 2017 වර්ෂය වෙනුවෙන් උසාවි දඩ වශයෙන් රු.1,500,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

වෙනත් ආදායම් - 1.6.60

1. (1.6.61) - ආයෝජන යටතේ ලැබෙන පොලී මුදල් යටතේ සභාව සතු ස්ථාවර තැන්පත් යටතේ අපේක්ෂිත පොලී ආදායම ලෙස රු.50,000.00 ක මුදලක් 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.

2. 1.6.62(2) - වෙනත් විකිණීම් යටතේ භාණ්ඩ වෙන්දේසි ආදායම් ආදිය වෙනුවෙන් රු.50,000.00ක මුදලක් 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.

3. 1.6.63 - මුද්දර ගාස්තු යටතේ ප්‍රදේශයේ සංවර්ධනයත් සමඟ සිදුවන ඉඩම් ගනුදෙනු කිරීම තුළින්, අය කරනු ලබන මුද්දර ගාස්තු වලින් සභාව වෙත ලැබෙන මුද්දර ගාස්තු ආදායම පෙන්වා ඇති අතර, ඒ වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.1,000,000.00ක ආදායමක් ඇස්තමේන්තු කර ඇත.

4. 1.6.64 - සේවක ණය පොලී යටතේ සභාවේ සේවකයින් වෙනුවෙන් ලබාදී ඇති සේවක ණය වලට ආදාලව අය කරනු ලබන පොලී ආදායම සඳහන් කර ඇති අතර, ඒ වෙනුවෙන් රු.120,000.00ක ආදායමක් 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.

ආදායම් අධාර - 1.7.70

- වැඩසටහන් අංක 01 යටතේ සේවයේ නියුක්ත කාර්යය මණ්ඩලය 26ක් වන අතර, ඒ අනුව 2017 වර්ෂය සඳහා වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් 1.7.71(1) යටතේ රු.11,206,000.00ක මුදලක් දකුණු පළාත් සභාව වෙතින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

- අප සභාවට අනුමත සභික සංඛ්‍යාව 10ක් වන අතර, 2017 වර්ෂය සඳහා සභික දීමනා ප්‍රතිපූර්ණය - 1.7.71(2) වෙනුවෙන් රු.1,980,000.00ක මුදලක් දකුණු පළාත් සභාව වෙතින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

- 1.7.71(3) - මෙම ආදායම් ශීර්ෂය යටතේ ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනට අදාලව 2017 වර්ෂය සඳහා රු.2,000,000.00 ක මුදලක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබේ යැයි අපේක්ෂා කර ඇස්තමේන්තු කර ඇත.

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## 2017 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු

වැඩසටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා

| අය ශීර්ෂය | අය විෂයයන් | ඇස්තමේන්තු ආදායම 2017 | ඇස්තමේන්තු ආදායම 2016 | සත්‍ය ආදායම (2016.06.30 දිනට) | සත්‍ය ආදායම 2015 |
|---|---|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | | | | |
| 1.1.11 | වරිපනම් බදු | - | - | - | - |
| 1.1.12 | අක්කර බදු | - | - | - | - |
| | එකතුව | - | - | - | - |
| 30 | බලපත්‍ර ගාස්තු | | | | |
| 1.3.35 | වාහන බලපත්‍ර (පාපැදි) | 200 | 400 | 100 | 141 |
| 1.3.36 | ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු | 500,000 | 600,000 | 62,330 | 581,080 |
| 1.3.37 | වෙනත් | | - | | |
| | එකතුව | **500,200** | **600,400** | **62,430** | **581,221** |
| 40 | සේවා සඳහා ගාස්තු | | | | |
| 1.4.41 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | - | 100,000 | 72,933 | 79,000 |
| 1.4.43 | නොපවරාගැනීමේ සහතිකපත් ගාස්තු | - | 25,000 | 21,719 | 35,150 |
| 1.4.44(1) | විශේෂ ගාස්තු (වාහන බලපත්‍ර සඳහා පරිපාලන වියදම්) | 300 | 600 | 150 | 4,674 |
| 1.4.44(2) | විශේෂ ගාස්තු | 5,000 | 5,000 | - | 493,258 |
| | එකතුව | **5,300** | **130,600** | **94,802** | **612,082** |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | | | | |
| 1.5.52 | උසාවි දඩ (පළාත් සභාවෙන්) | 1,500,000 | 1,500,000 | 155,169 | 1,187,165 |
| 1.5.59 | උසාවි දඩ නොවන වෙනත් දඩ | - | | - | |
| | එකතුව | **1,500,000** | **1,500,000** | **155,169** | **1,187,165** |
| 60 | වෙනත් ආදායම් | | | | |
| 1.6.61 | ආයෝජන යටතේ ලැබෙන පොලී මුදල් | 50,000 | 10,000 | 3,126 | 111,097 |
| 1.6.62(1) | ආකෘති හා පෝරම ආදිය විකිණීම | - | 5,000 | 3,500 | 32,500 |
| 1.6.62(2) | වෙනත් විකිණීම් | 50,000 | 50,000 | - | - |
| 1.6.63 | මුද්දර ගාස්තු | 1,000,000 | 500,000 | - | 382,350 |
| 1.6.64 | සේවක ණය පොලී | 120,000 | 100,000 | 59,410 | 89,341 |
| | එකතුව | **1,220,000** | **665,000** | **66,036** | **615,288** |
| 70 | ආදායම් ආධාර | | | | |
| 1.7.71(1) | කාර්යය මණ්ඩල වැටුප් ප්‍රතිපූර්ණය | 11,206,000 | 12,075,000 | 5,542,106 | 19,817,980 |
| 1.7.71(2) | සභික දීමනා ප්‍රතිපූර්ණය | 1,980,000 | 2,000,000 | - | 1,043,040 |
| 1.7.71(3) | සේවා ආධාර (ප්‍රා.සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ) | 2,000,000 | | | |
| | එකතුව | **15,186,000** | **14,075,000** | **5,542,106** | **20,861,020** |
| | මුළු පුනරාවර්තන ආදායම | **18,411,500** | **16,971,000** | **5,920,543** | **23,856,775** |

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## 2017 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු

| වැඩසටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා | | | | | |
|---|---|---|---|---|---|
| වියදම් ශීර්ෂය | වැය විෂයයන් | ඇස්තමේන්තු වියදම 2017 | ඇස්තමේන්තු වියදම 2016 | සත්‍ය වියදම (2016.06.30 දිනට) | සත්‍ය වියදම 2015 |
| 101 | පෞද්ගලික පඩිනඩි | | | | |
| 101(1) | වැටුප් හා වේතන | 8,713,700 | 9,250,000 | 4,443,708 | 8,016,381 |
| 101(2) | අතිකාල හා නිවාඩු දින වැටුප් | 150,000 | 200,000 | 63,001 | 99,354 |
| 101(3) | නිල ඇඳුම් දීමනා | 28,000 | - | - | - |
| 101(6) | ජීවන අංක දීමනා | 2,433,600 | 2,550,000 | 1,146,990 | 2,287,480 |
| 101(9)I | සභාපති ඇතුළු සභික දීමනා | 1,980,000 | 2,000,000 | - | 698,370 |
| 101(9)II | ලේකම් තනතුරේ වැඩ බැලීමේ දීමනා | 180,000 | 48,000 | 52,000 | 93,000 |
| 101(9)III | සම්බන්ධීකරණ නිලධාරී දීමනා | 54,000 | 54,000 | - | 4,500 |
| 101(9)IV | රෝනියෝ යන්ත්‍ර/මුදල් පරිහරණ දීමනා | 600 | 5,000 | 1,394 | 600 |
